*සැ. යු.* - 2015.07.10 වැනි දින පළ වූ අංක 1,923 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,924 - 2015 ජූලි මස 17 වැනි සිකුරාදා - 2015.07.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1216 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1218 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1221 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1223 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1225 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1228 |

*සැ. යු.-* සේවක අයවැය සහන දීමනා පනත් කෙටුම්පත 2015 මැයි මස 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අගෝස්තු මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජූලි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිල ගණන් කැඳවීමයි**

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2015***

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට මිල ගණන් 2015.07.27 වැනි දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05 ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *මිල ගණන් භාර ගැනීම* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|
| බස්නාහිර පළාත | ගම්පහ | මීරිගම | පළාත් සර්වේයර් ජනරාල් (බස්නාහිර පළාත) සර්වේයර් ජනරාල් කාර්යාලය, අංක 150, කිරුල පාර, නාරාහේන්පිට, කොළඹ 05. | පස්යාල නගරය අවට | 2015.08.01 |

*සපුරාලිය යුතු පොදු අවශ්‍යතා :*

සෑම ගොඩනැගිල්ලක්ම ආරක්ෂිත වැටකින් හෝ තාප්පයකින් ආරක්ෂා වී තිබිය යුතුය. ජල නළ පහසුකම් තිබිය යුතු අතර, අප ද්‍රව්‍ය හෝ ජලය ඉවත් කිරීමේ ක්‍රමවත් පද්ධතියක් තිබිය යුතු ය. ජල හා විදුලි මීටර් වෙන වෙන ම තිබිය යුතු ය. යාබදව අධික ශබ්ද නැගෙන කර්මාන්තශාලා හෝ එවැනි වෙනත් දෑ නොතිබිය යුතු ය. ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට යාබදව නොවේ නම් ඒ සඳහා ක්‍රමවත් පිවිසුම් මාර්ගයක් තිබිය යුතු ය.

පහත දක්වා ඇති ආකෘතියට අනුව සකසන ලද ඉල්ලුම් පත්‍ර, සපුරාලිය යුතු පොදු අවශ්‍යතා විස්තර ද, සහිතව, ලිපි කවරයේ ඉහල වම් කෙළවරෙහි " ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම" (ස්ථාන නාමය) යනුවෙන් සඳහන් කර, 2015.07.27 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

සර්වේයර් ජනරාල්.

2015 ජූනි මස 29 වැනි දින,
කොළඹ 05, කිරුල පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

*ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2015*

**මිල ගණන් කැඳවීමේ ඉල්ලුම්පත්‍රය - 2015**

ගොඩනැගිලි අයිතිකරුගේ -

1. සම්පූර්ණ නම : _____________.
2. ලිපිනය : _____________.
3. දුරකථන අංකය : _____________.
4. ජාතික හැඳුනුම්පත් අංකය : _____________.

ගොඩනැගිල්ල -

1. කුලියට දෙනු ලබන්නේ කුමන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ද? : _____________.
2. මාසික කුලී මුදල : _____________.
3. පිහිටි ස්ථානයේ ලිපිනය : _____________.
4. අදාළ නගරයේ සිට පිහිටි ස්ථානයට ඇති දුර ප්‍රමාණය කි. මී. : _____________.
5. වර්ග අඩි ප්‍රමාණය හා කාමර ගණන : _____________.

6. වෙනම කියවිය හැකි ජල මීටර් තිබේ ද? : _____________.
7. වෙනම කියවිය හැකි විදුලි මීටර් තිබේ ද? : _____________.
8. ආරක්ෂිත මායිම් විස්තර සපයන්න (තාප්පය/කම්බි වැට/...........................) : _____________.
9. නවතා තැබීමට හැකි වාහන ගණන : _____________.
10. ප්‍රධාන මාර්ගයට පිවිසීමට ගත වන කාලය : _____________.
11. මනාව සැකසුණ සනීපාරක්ෂක තත්වය (විස්තර සහිතව) : _____________.
12. දුරකථන පහසුකම් තිබේ නම් දුරකථන අංකය : _____________.

ඉහත තොරතුරු සත්‍ය බවත් යම් තොරතුරක් අසත්‍ය බව හෙළිවුවහොත් මවිසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සර්වේයර් ජනරාල් ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දන්නා බවත් මෙයින් පිළිගනිමි.

_____________.
අයදුම්කරුගේ අත්සන.

07-605

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ELECTRIC POWER COACHES SHED සහ POWER COACHES SHED සඳහා ටොන් 100 SYNCHRONIZED LIFTING JACKS කට්ටල (SETS) දෙකක් (02) සැපයීම සඳහා ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංක : SRS/F 7243.

ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, තැ. පෙ. 355 හි දුම්රිය මූලස්ථානයේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ, සභාපති විසින්, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ EPCS සහ PCS ෂෙඩ් සඳහා ටොන් 100 Synchronized Lifting Jacks කට්ටල (SETS) දෙකක් (02) සැපයීම සඳහා නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. නිෂ්පාදකයින්ට, ස්වකීය ඇටර්නි බලය මගින් තමන් විසින් බලය පවරන ලද බලයලත් ඒජන්තවරයෙකු මාර්ගයෙන් සිය ලංසු ඉදිරිපත් කළ හැකි ය.

02. ලංසු භාර ගැනීම 2015 අගෝස්තු මස 04 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට අවසන් වේ.

03. ලංසු, ආපසු ගෙවනු නොලබන රු. 2,500 ක් පමණක් වන හෝ පහසුවෙන් පරිවර්තනය කරගත හැකි මුදල් වර්ගයකින් ඊට සමාන මුදලක් ගෙවීමෙන් අනතුරුව 2015 අගෝස්තු මස 03 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 3.00 දක්වා, ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මත ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු, එම ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, තැ. පෙ. 355, දුම්රිය මූලස්ථාන කාර්යාලයේ දී විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පැමිණ සිටිය හැකි ය.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ සිදුකළ යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. ලංසු ලිපිලේඛන, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි ය.

07. වැඩිදුර විස්තර සඳහා කරුණාකර විමසන්න :-

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කොට් මාවත,
කොළඹ 10. ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ
94 (11) 2473328
ෆැක්ස් : 94 (11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7243

07-852

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ශ්‍රී ලංකා දුම්රිය සේවයට HIGH FRICTION COMPOSITE BRAKE BLOCKS 25,000 සැපයීම සඳහා ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංක : SRS/F. 7244.

ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, තැ. පෙ. 355 හි දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන

කමිටුවේ, සභාපති විසින්, ශ්‍රී ලංකා දුම්රිය සේවයට High Friction Composite Brake Blocks 25,000 ක සංඛ්‍යාවක් සැපයීම සඳහා නිෂ්පාදකයින්ගෙන්/සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. නිෂ්පාදකයින්ට, ස්වකීය ඇටර්නි බලය මගින් තමන් විසින් බලය පවරන ලද ඒජන්තවරුන් මාර්ගයෙන් ලංසු ඉදිරිපත් කළ හැකි ය.

02. ලංසු භාර ගැනීම 2015 අගෝස්තු මස 07 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට අවසන් වේ.

03. ලංසු, ආපසු ගෙවනු නොලබන, ප්‍රසම්පාදන ගාස්තුවක් වන රු. 2,500 ක මුදලක් හෝ පහසුවෙන් පරිවර්තනය කර ගත හැකි මුදල් වර්ගයකින් ඊට සමාන මුදලක් ගෙවීමෙන් අනතුරුව, 2015 අගෝස්තු මස 06 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 3.00 දක්වා ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල (තානාපති කාර්යාල) වෙතින් ලබාගත හැකි ආකෘති පත්‍ර මත ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු, එම ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, තැ. පෙ. 355 හි, දුම්රිය මූලස්ථාන කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. එම ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුවනට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පැමිණ සිටීමට අවසර ඇත.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ සිදුකළ යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. ලංසු ලිපිලේඛන, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි ය.

07. වැඩිදුර විස්තර සඳහා කරුණාකර විමසන්න :-

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කොට් මාවත,
කොළඹ 10. ශ්‍රී ලංකාව.

| | |
|---|---|
| දුරකථන අංක : | 94 (11) 2438078 හෝ |
| | 94 (11) 2473328 |
| ෆැක්ස් අංක : | 94 (11) 2432044 |
| ඊමේල් : | srs.slr@gmail.com |
| වෙබ් අඩවිය : | www.railway.gov.lk |

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7244

07-853

# බඩු බාහිරාදිය විකිණීම්

මගේ අංකය : අවි/මහේ/අධි/නඩු භාණ්ඩ වෙන්දේසිය/2015.

**අයිතිකරුවන් මෙතෙක් ඉදිරිපත් නොවුන සහ රාජසන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2015.08.30 වැනි දින පෙරවරු 10.00 ට මෙම අධිකරණ භූමියේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් විය යුතු ය.

3. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසියට පැය භාගයකට පෙර විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

4. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

5. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් එවලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලු ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

6. වෙන්දේසියෙන් මිලදී ගන්නා ද්‍රව්‍ය සඳහා ගැණුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

ගුණේන්ද්‍ර කුමාර මුණසිංහ,
මහෙස්ත්‍රාත්,
අවිස්සාවේල්ල.

2015 ජුනි මස 30 වැනි දින,
අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

2015.08.30 වැනි දින පැවැත්වීමට නියමිත අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ වල වෙන්දේසි ලැයිස්තුව

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය | පිටු අංකය |
|---|---|---|---|---|
| 01. | 68674 | ලී කැපීමට යොදා ගන්නා දම්වැල් | | |
| | | කියත් | 01 | 09-23 |
| 02. | 84485 | 12.5 Kg කහ පැහැති ලාෆ්ස් ගෑස් | | |
| | | සිලින්ඩර | 01 | 09-187 |
| 03. | 76092 | පෙති යකඩ | 01 | |
| | | පොරව | 01 | |
| 04. | 32240 | පෙති යකඩ | 01 | |
| | | උදලු | 01 | |
| | | කූඩ | 01 | |
| 05. | 85759 | ඉල්ලන් කූරු | 01 | 10-35 |
| | | ඉල්ලුන් කූඩ | 01 | |
| 06. | 84749 | ඉල්ලන් කූරු | 01 | |
| 07. | 70361 | යකඩ මිට සහිත කැති | 01 | 07-146 |
| 08. | 54460 | අඟල් 8 x 8 යකඩ ප්ලේට් | 01 | |
| 09. | 53975 | යකඩ මිට සහිත සවල් | 01 | 07-01 |
| | | යකඩ බාල්දි | 01 | |
| 10. | 81660 | ඉල්ලන් කූරු | 01 | 09-36 |
| 11. | 84757 | උදළු | 01 | |
| 12. | 75037 | වක් පිහිය | 01 | 07-181 |
| 13. | 76091 | බන්ඩි කියත් | 01 | |
| | | පිහිය | 01 | |
| 14. | 82209 | හිරමන තල | 01 | ඒ 2 -4 |
| | | පිහිය | 05 | |
| 15. | 85302 | ඇලුමිනියම් ලොකු මුට්ටි | 01 | 10-16 |
| 16. | 84669 | ඇලුමිනියම් ලොකු මුට්ටි | 01 | 09 - 192 |
| 17. | 78402 | ඔට්ට පාලු කුඩා උර | 01 | 08 - 11 |
| 18. | 66484 | ඔට්ට පාලු කුඩා උර | 01 | |
| 19. | බී/ | | | |
| | 4311/13 | කුඩා ඇලුමිනියම් මුට්ටි | 01 | |
| | | කුඩා ඇලුමිනියම් සාස් පාන් | 01 | |
| 20. | - | නඩු අංක රහිත කුඩා ප්ලාස්ටික් | | |
| | | ජෝගු | 07 | |
| 21. | 72240 | අත් කියත් | 01 | 10-23 |
| | | නියන් | 01 | |
| 22. | 84648 | අත් කියත් | 01 | 10-23 |
| | | නියන් | 01 | |
| | | අත කොළු | 01 | |
| 23. | 35367 | අත් කියත් | 01 | 10 - 23 |
| | | නියන් | 01 | |
| | | අත කොළු | 01 | |
| 24. | 53704 | ඉලෙක්ට්‍රොනික් ගයින්ඩර් | 01 | 10-23 |
| 25. | 78924 | අත් පොරව | 01 | 10 - 24 |
| 26. | 71056 | වක් පිහිය | 01 | 07 - 175 |
| 27. | 71055 | වක් පිහිය | 01 | |
| 28. | 71054 | වක් පිහිය | 01 | |
| 29. | 69329 | වක් පිහිය | 01 | 07 - 135 |
| 30. | 75038 | බන්ඩි කියත් | 01 | 07 - 181 |
| | | ටෝච් | 01 | |
| | | ටෝච්ාවොන | | |
| 31. | 49303 | පිහිය | 01 | 09 - 92 |
| 32. | 61187 | නියන් | 01 | 09 - 190 |
| | | අතකොළු | 01 | |
| 33. | 38172 | නියන් | 01 | |
| | | අතකොළු | 01 | |
| 34. | 69252 | කුඩා මිටි | 01 | |
| | | නියන් | 01 | |
| | | අත කොළු | 01 | |
| 35. | 69249 | නියන් | 01 | |
| 36. | 84772 | ඇලුමිනියම් මුට්ටි | 01 | 09 - 197 |
| 37. | 84758 | ඇලුමිනියම් මුට්ටි | 01 | 09 - 196 |
| | | ඇලුමිනියම් කළ | 01 | |
| 38. | 83346 | ඇලුමිනියම් මුට්ටි | 01 | 09 - 147 |
| 39. | 84400 | යකඩ බාල්දි | 01 | 09 - 185 |
| | | කහ පැහැති ඔක්සිජන් බට | 01 | |
| 40. | 81957 | රෙගුලේටරය සහිත වට 03 ගෑස් ලිප් | 01 | 09 - 97 |
| | | ගෑස් සිලින්ඩර | 01 | |
| 41. | 85752 | නිල් පාට 12.5 ෂෙල් ගෑස් සිලින්ඩර | 01 | 10 - 32 |
| | | රෙගුලේටරය සහිත වට 04 ගෑස්ලිප් | 01 | |
| 42. | 82157 | EY රොබින් වර්ගයේ කහ පාට | 01 | 09 - 104 |
| | | එන්ජිම හා වායු පුරවනය | | |
| | | මවුත් කොටස සවිකර ඇති කහ | 01 | |
| | | පැහැති ඔක්සින් බට | | |
| | | එයා කොම්පෙෂර් යන්ත්‍ර | 01 | |
| | | යකඩ බාල්දි | 01 | |
| 43. | 81152 | අඩි 04ක් පමණ අලවංගු | 01 | 09 - 68 |
| | | පොරව | 01 | |
| | | පිහිය | 01 | |
| 44. | 84011 | උදළු | 01 | 09 - 172 |
| | | ඉල්ලන් කූරු | 01 | |
| | | ප්ලාස්ටික් තාච්චි | 02 | |
| | | බටපොතු කූඩ | 01 | |
| 45. | 82156 | EY 08 රොබින් එන්ජිමට බද්ධ | | |
| | | කර ඇති වායු පීඩන | 01 | 09 - 104 |
| | | මවුත් එක සමග කහ පැහැති | | |
| | | ඔක්සිජන් බට අඩි 114 | 01 | |
| | | රතු පැහැති හුලං පිරවුම් යන්ත්‍ර | 01 | |
| 46. | 49249 | ඔලිම්පියා වර්ගයේ සිල්ව පාට පාපැදි | 01 | 07-18 |
| | | රබර් ෂීට් | 01 | |
| | | අඟල් 23ක් දිග යකඩ කූරු | 01 | |
| 47. | 78352 | යකඩ ඉනි | 02 | බී 8- 64 |
| | | බන්ඩි කියත් | 01 | |
| | | පොරව | 01 | |
| | | අත් පොරව | 02 | |
| | | ඇලුමිනියම් වළං | 03 | |
| | | පිහිය | 01 | |
| | | විදුලි පන්දම් | 01 | |
| 48. | ඒආර් | | | |
| | 5871 | හිල් විදින ලද බාල්දි | 06 | ඒආර් 01-147 |
| 49 | ඒආර් | | | |
| | 81932 | ඉස්කුරුප්පු නියන් | 02 | ඒආර් 02-04 |
| | | පිහිය | 02 | |
| | | කාර් කැසට් යන්ත්‍ර | 01 | |
| | | පරිගණක රැම් | 01 | |
| | | රතු පාට කැඩුණු අත් ඔරලෝසු | 01 | |
| | | කේ වයි මේස ලාම්පු | 02 | |
| | | බෆල් | 02 | |
| | | ඔට්ටපාලු උර | 02 | |
| 50 | 67168 | බන්ඩි කියත් | 01 | 07- 119 |
| 51. | 47361 | ඇග්රෝ වර්ගයේ වතුර එන්ජින් | 01 | 06 - 149 |

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය | පිටු අංකය |
|---|---|---|---|---|
| | | උදළු තල | 02 | |
| | | යකඩ ඉල්ලන් කූරු | 02 | |
| | | ඉල්ලන් කුඩ | 04 | |
| 52. | 70103 | අඩි 04ක් අගල් 10ක් උස ඔක්සිජන් ටැංකි | 03 | 07 - 142 |
| | | අඩි 30ක් දිග කහපාට වායු බට | 01 | |
| | | අඩි 17ක් දිග කලු පාට වායු බට ටියුබ් | 01 | |
| | | ගැරුම් වට්ටි | 01 | |
| 53. | 64853 | 12.5Kg ලාෆ් ගෑස් සිලින්ඩර් | 02 | නිවිම පොත 2011 |
| | | නිපල් 04 ගෑස් උඳුන් | 01 | |
| 54. | 63641 | ඇදුම් උදලු තල | 01 | |
| 55. | 86067 | ඇලුමිනියම් මුට්ටි | 01 | 10 - 41 |
| 56. | 44230 | 12.5Kg ලාෆ් ගෑස් සිලින්ඩර් | 04 | නිවිම 44 |
| 57. | 64755 | උස අඩි 05.09 ඔක්සිජන් සිලින්ඩර් | 01 | |
| | | මවුත් කොටස සවි කරන ලද අඩි 66ක් දිග කලු පාට වායු බට | 01 | |
| | | මවුත් කොටස සවි කරන ලද අඩි 33ක් දිග වායු බට | 01 | |
| | | අඩි 28ක් දිග වායු රබර් බට | 01 | |
| 58. | 69547 | EY 08 රොබින් කොම්පෙෂර් යන්ත්‍ර | 01 | |
| | | ඇදුම් උදළු තල | 01 | |
| | | යකඩ බාල්දි | 01 | |
| | | බට පතුරු වට්ටි | 01 | |
| 59. | 64754 | උස අඩි 5.2 පමණ ඔක්සිජන් සිලින්ඩර | 01 | |
| | | මවුත් කොටස සවි කරන ලද අඩි 53ක් දිග කලු පාට රබර් වායු බට | 01 | |
| | | මවුත් කොටස සවි කරන ලද අඩි 36 කලු පාට රබර් බට | 01 | |
| | | අඩි 26 දිග නිල්පාට වායු බට | 01 | |
| 60. | 43877 | නිල් පාට වායු පුරවන | 01 | |
| | | කහ පාට ඔක්සිජන් වායු බට | 01 | |
| | | කහ පාට එන්ජිම හා වායු පිරවුම් යන්ත්‍ර | 01 | |
| 61. | 41078 | නිල් පාට වායු පුරවන | 01 | |
| | | ඔක්සිජන් වායු බට | 01 | |
| 62. | 83872 | බිම් තරාදියක වෙල්ලිය | 01 | |
| | | කිරුම් පඩි පෙල | 01 | |
| 63. | 83020 | බාල්දි | 01 | |
| | | සවල් | 01 | |
| 64. | 84867 | සුළං පුරවන ලද රබර් ටියුබ් | 02 | ඒආර් 02 - 05 |
| | | ගැරුම් වට්ටි | 02 | |
| | | ඔක්සිජන් අඩංගු යකඩ සිලින්ඩර් | 01 | |
| | | මීටරය හා මවුත් එක සවිකරන ලද බට | 01 | |
| | | යකඩ ප්ලේට් | 01 | |
| | | වායු මීටර් දෙකක් සවි කළ අඩි 5ක් උස ඔක්සිජන් සිලින්ඩර් | 01 | |
| | | කහපාට අඩි 15ක් දිග මවුත් බට | 01 | |
| | | බට ලී වැලි කුඩ | 02 | |
| | | කහපාට අඩි 45 ක මවුත් එක සමග රබර් නලය සමග මවුත් බටය සවි කරන ලද ඔක්සිජන් සිලින්ඩර් | 01 | |
| | | සුළං පුරවන ලද රබර් ටියුබ් | 02 | |
| | | ගැරුම් වට්ටි | 01 | |
| | | අඩි 10ක් දිග දඹර කඳන් | 01 | |
| | | අඩි 2 1/2 x 4 යකඩ ප්ලේට් | 01 | |
| | | අඩි 05ක් උස ඔක්සිජන් සිලින්ඩර | 01 | |
| | | යකඩ බැරල් දෙකකින් යුතු බැරල් | 04 | |
| | | අඩිය සිදුරු කරන ලද යකඩ බාල්දි | 01 | |
| | | ගැරුම් වට්ටි | 02 | |
| 65. | ඒආර් 86216 | බට පොතු ගැරුම් වට්ටි | 03 | ඒආර් 02 - 04 |
| | | යකඩ බාල්දි | 01 | |
| | | යකඩ කැට කුඩ | 03 | |
| | | අඩි 17ක් දිග දඹර කඳන් | 01 | |
| | | අඩි 12ක් දිග දඹර කඳන් | 01 | |
| | | ගැරුම් වට්ටි | 01 | |
| | | උස අඩි 05ක් උස ඔක්සිජන් ටැංකි | 02 | |
| 66. | ඒආර් 5869 | අඩි 05ක් පමණ උස ඔක්සිජන් සිලින්ඩර | 01 | ඒආර් 01 - 147 |
| | | කහපාට රබර් බටය සහිත වායු බට | 01 | |
| 67. | ඒආර් 5870 | අඩි 05ක් පමණ උස ඔක්සිජන් සිලින්ඩර් | 01 | |
| | | ඊයම් කැබලි | 02 | |
| | | හිස් වැසුම් | 01 | |
| 68 | ඒආර් 2415/12 | හොණ්ඩා වර්ගයේ 91 - 9033 දරන යතුරු පැදි | 01 | ඒආර් 01- 142 |
| 69. | ඒආර් 2414/12 | අංක රහිත යතුරු පැදි | 01 | ඒආර් 01 - 142 |
| 70. | ඒආර් 2413/12 | බජාජ් ඩිස්කවරි වර්ගයේ අංක ඩබ්පී -එම්සී - 0394 දරන යතුරු පැදි | 01 | ඒආර් 01 -142 |
| 71. | 44178 | 206 - 7128 දරන බජාජ් ත්‍රිරෝද රථ | 01 | 07 - 84 |
| 72. | 61441 | අත් ට්‍රැක්ටර් එන්ජින් | 01 | 07 - 70 |
| 73. | - | නඩු අංකය රහිත දිරාපත් වී ඇති පැරණි කාර් රථ | 01 | - |
| 74. | | නඩු අංක රහිත සවල් | 04 | |
| 75. | | නඩු අංක රහිත සින්තටික් පැදුරු | 06 | |
| 76. | | නඩු කිහිපයකට අත් ප්ලාස්ටික් බූලි තොගයක් | | |
| 77. | | නඩු කිහිපයකට අයත් ප්ලාස්ටික් කෑන් තොගයක් | | |
| 78. | | නඩු කිහිපයකට අයත් යකඩ බැරල් | | |
| 79. | | නඩු කිහිපයකට අයත් වීදුරු බෝතල් තොගයක් | | |
| 80. | | නඩු කිහිපයකට අයත් තඹ දඟරයට සවි කර තිබූ හෝස් කෑලි තොගයක්. | | |

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ 2016 වර්ෂයේ රා මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම**

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂයේ හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත් එම කාලය තුළ දී වලංගුව පවත්වාගෙන යන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 2016 වර්ෂය තුළ රා සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිල දී ගැනීම සඳහා මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් වන මවිසින් 2015.08.19 වැනි දින පෙරවරු 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි ආකෘති පත්‍රයකින් සකස් විය යුතු අතර,

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් කර ඇති අන්දමට ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථොක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතා ගැන විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය ;
(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතු ය ;
(iii) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපාහැරීමක් මත ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය ;
(iv) අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත්කර ලබාගන්නා ලද -

*(අ)* ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ කුවිතාන්සිය ; සහ
*(ආ)* වත්කම් සහතිකයක්

සමඟ ලියුම් කවරයක බහා මුද්‍රා තබන ලියුම් කවරයෙහි වම් කෙළවරේ "තැබෑරුමේ නම සහ අංකය" සඳහන් කර මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට ප්‍රථම තැන්පත් කළ යුතු ය. එසේ නැතහොත් ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම මහනුවර ප්‍රාදේශීය ලේකම්තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් රේන්දයක් වෙනුවෙන් භාර ගැනීම අවසන් කරන වේලාව උපලේඛනයෙහි සඳහන් කර ඇත. එම වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය වරප්‍රසාද මිල දී ගත් තැනැත්තායි ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු එම දින පස්වරු 2.30 ට පෙර මහනුවර ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.

මෙම ගෙවීම මුදලින් හෝ බැංකුවක් විසින් **"ගෙවීම සඳහා"** යැයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් **"ආරක්ෂිත චෙක්පත් "** නමැති ස්වරූපයකින් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට මත්පැන් තැබෑරුම් කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය.

06. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකිය.

07. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙන ම පැහැදිලිව දැක්විය යුතු ය.

08. රා තැබෑරුම්වල හෝ වෙනත් බලපත්‍රයක් ලත් ස්ථානවල හෝ විකිණීම සඳහා තොග (පීප්ප) රා නිකුත් නොකරනු ලබන බව සැලකිය යුතු ය.

09. මහනුවර ඇසළ පෙරහැර සමයේ දී හා වෙනත් හේතූන් මත මෙහි උපලේඛනයේ සඳහන් අංක 01 දරන රා තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තැබීමේ කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

10. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2015.10.14 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

11. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි හෝ වෙනත් වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැකිය.

බී. එම්. පී. ජී. පී. වී. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළය.

2015 ජූනි මස 29 වැනි දින,
මහනුවර සහ කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

**2016 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තුව**

| | *අනුක්‍රමික අංක, කොට්ඨාසය, තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය, තැබෑරුම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|
| 01. | අංක 1 වටපුළුව | මහනුවර කොට්ඨාසයේ අංක 20 මහයියාව සහ අංක 7 මාපනාවතුර ඡන්ද කොට්ඨාසය | කටුගස්තොට පාරේ එම පාර සහ ත්‍රිකුණාමල වීදිය මංසන්ධියෙහි කටුගස්තොට පාර සහ වට්ටාරන්තැන්න මංසන්ධිය අතර පාර මහනුවර නාගරිකයේ අංක 20 මහයියාව සහ අංක 7 මාපනාවතුර ඡන්ද කොට්ඨාසය තුළ පිහිටි ප්‍රදේශය | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා සහ ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2015.08.19 පෙ. ව. 10.30 |

*රා තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු ටෙන්ඩර් තැන්පත් මුදල - 2016 :*

| |
|---|
| අංක 1 වටපුළුව - රා තැබෑරුම් රේන්දය රුපියල් 5,000. |

07-771/1

# රජයේ නොවන දැන්වීම්

## නිවේදනයයි

බේර ලේක් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් 2015 මැයි මස 25 වැනි දින සංස්ථාපනය දරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : බේර ලේක් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 101646
ලියාපදිංචි කාර්යාලය : අංක 50, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව.

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

07-592

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥපනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම නම වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැරණි නම : නැචුරල් බැක් හෙල්ත් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 90928
ලියාපදිංචි කාර්යාලය : අංක 89, නව ගාළු පාර, එගොඩ උයන, මොරටුව
සමාගමේ අළුත් නම : නැචුරල් බැක් හෙල්ත් හොස්පිට්ල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නම වෙනස් කළ දිනය : 2015.03.24

වෝටර්ස් සෙකටේරියල් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී.

07-617

---

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

මඩකලපුව, නාවට්කුඩා, උඩුමහල් පාර, අංක 47 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 515162500 වී දරන කමලාදේවි පුෂ්පරාජ් මිය වන මා විසින් එම ලිපිනයෙහිම පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 522042267 වී දරන ජෝෂප් පුස්පරාජ් මයා යන අයට ලබා දෙනු ලැබූ, මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් එස්. ස්ටෙනිස්ලොස් මහතා විසින් සහතික කරනු ලැබූ අංක 1366 දරන හා 2009.12.31 දිනැති ඇටෝර්නි බලය මෙයින් අවලංගු කර බලරහිත කරමි.තවද, ඉහත ජෝශප් පුස්පරාජ් මයා විසින් මෙම ඇටෝර්නි බලය උපයෝගි කරමින් සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ ගණුදෙනුවක් සඳහා මා වගකිය යුතු පුද්ගලයෙක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු ජනතාව වෙත දන්වා සිටිමි.

කමලාදේවි පුෂ්පරාජ් මිය.

07-649

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ජේදය යටතේ

සමාගමේ නම : නවාරා ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105347
සංස්ථාගත කළ දිනය : 2015.04.29
ලිපිනය : අංක 65/3, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

ලේකම්වරු.

07-667

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ජේදය යටතේ

සමාගමෙ නම : ප්ලස් වන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105356
සංස්ථාගත කළ දිනය : 2015.04.29
ලිපිනය : අංක 253/5, පොල්හේන්ගොඩ පාර, කිරුළපන, කොළඹ 05.

ලේකම්වරු.

07-668

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ජේදය යටතේ

සමාගමේ නම : නවාරා එක්ස්පෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105255
සංස්ථා ගත කල දිනය : 2015.04.27
ලිපිනය : අංක 65/3, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

ලේකම්වරු.

07-669

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ජේදය යටතේ

සමාගමේ නම : එක්රේන් ටෙක්නොලොජිස් ඇන්ඩ් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105271
සංස්ථා ගත කළ දිනය : 2015.04.27
ලිපිනය : අංක 393, යූනියන් පෙදෙස, කොළඹ 02.

කොම්සෙකි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

07-670

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

මාරවිල තැපැල්, තල්විල, ''තේමාස්'' හි පදිංචි කුඩාමානගේ දෙන් එල්ස්ටන් පෙරේරා වන මා 2004 ජූලි මස 16 වැනි දින ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ගුණවර්ධන මහතා විසින් සහතික කළ අංක 11942 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් මාරවිල තැපැල්, තල්විල, තේමාස් හි පදිංචි වර්ණකුලසූරිය ඩොනාටා පෙරේරා වෙත පවරා තිබූ ඇටෝර්නි බලය වර්ෂ 2015ක් වූ ජුනි මස 30 වැනිද සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර ශූන්‍ය කර බලරහිත කළ බවත්, මින්මතු වර්ණකුලසූරිය ඩොනාටා පෙරේරා මා වෙනුවෙන් හෝ මාගේ නාමයෙන් කරන කිසිම ක්‍රියාවකට මා වග නොකියන බවත් මෙමගින් ශ්‍රී ලංකා ජනරජයට හා මහජනතාවට දැනුම් දෙමි.

කුඩාමානගේ දෙන් එල්ස්ටන් පෙරේරා,
ඇටෝර්නි අධිපති.

2015 ජුනි මස 30 වැනි දින.

07-721

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) අනුව 2015.06.24 වැනි දින පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සිමල්සි කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 106543
ලියාපදිංචි ලිපිනය : 160 ඒ, පූර්වාරාම පාර, කිරුළපන, කොළඹ 05.

අධ්‍යක්ෂ.

07-750

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන ප්‍රසිද්ධ නිවේදනයයි.

සමාගමේ නම : තිළිණි මැන්පවර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 88611
ලියාපදිංචි ලිපිනය : මෛත්‍රීපාල සේනානායක මාවත, 5 වැනි පටුමග, අංක 521/60, අනුරාධපුර.

ලේකම්,
අධ්‍යක්ෂ.

07-812

---

### මහජනයා වෙත කරනු ලබන නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 5 වැනි වගන්තියට අනුව පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : මංජු එන්ටර්ප්‍රයිසස් ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලිපිනය : අංක 357, කාර්මික පෙදෙස, බුත්තල
සමාගම ලියාපදිංචි අංකය : පී වී 106590
සංස්ථාගත කළ දිනය : 2015.06.26

07-834

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර, පහත සඳහන් සමාගම, සංස්ථාගත කරන ලද බැව් මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : වූනබේ සී ෆුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී. 106007
සංස්ථාගත කළ දිනය : 2015 ජුනි මස 1 වැනි දින (2015.06.01)
ලියාපදිංචි ලිපිනය : අංක 299, පොතුවිල් පාර, අක්කරෙයිපත්තු 01

07-849

---

### විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකාවේ, සියඹලාපේ, සියඹලාපේ උතුර, දලුක්කැලේ, අංක 310/20 දරන ස්ථානයේ පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 612540217 V හිමි) මද්දුම බණ්ඩාරගේ ලක්ෂමන් පෙරේරා වන මම ශ්‍රී ලංකාවේ, දෙල්ගොඩ, මීගහවත්ත, උඩුපිල පාරේ අංක 108/9 දරන ස්ථානයේ පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 567021300 V හිමි) මද්දුම බණ්ඩාරගේ චන්ද්‍රා අයිරාංගනී පෙරේරා යන අයට ප්‍රදානය කරන ලද 2015.03.10 වැනි දින කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. පී. වී. මුණසිංහ මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 1447 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවද, මින් ඉදිරියට එකී විශේෂ ඇටෝර්නි බලපත්‍රය යටතේ මා වෙනුවෙන් ඇය විසින් කරනු ලබන කිසිම ක්‍රියාවකට මා වග නොකියන බවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා පොදු ජනතාවට මෙයින් දන්වා සිටිමි.

මද්දුම බණ්ඩාරගේ ලක්ෂමන් පෙරේරා.

2015 ජූලි මස 03 වැනි දින දී ය.

07-880

---

### ඇටෝර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

මහනුවර, පිටකන්ද පාර, මහයියාව, අංක 125 හි පදිංචි මානෙල් ජයවික්‍රම විජේතුංග මෙනවිය, වන මා විසින්, තෙලිජ්ජවිල ඇල්ගිරිය උඩකුඹුර වත්ත පදිංචි (ජා. හැ. අංක 6002932420 V) පිටදූව ගමගේ ගුණසේන, වෙත පවරන ලද ප්‍රසිද්ධ නොතාරිස් අබේරත්න බණ්ඩාර, විසින් ලියා සහතික කළ අංක 14310 සහ 2007.09.04 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලැබේ.

මානෙල් ජයවික්‍රම විජේතුංග.

07-890

---

### සමාගම් සංස්ථාපිත කළ බවට ප්‍රසිද්ධ කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ද අයිකොන් ක්වීන් (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති සමාගම සංස්ථාපනය කරන ලදී.

ලියාපදිංචි අංකය : P V 106585
ලියාපදිංචි කාර්යාලය : අංක 966/සී/2 පන්නිපිටිය පාර, අක්කර අට වත්ත, පැලවත්ත, තලංගම දකුණ, බත්තරමුල්ල.

07-891

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා සහ විදේශ මත්පැන් තැබෑරුම් විකිණීම - 2016 වර්ෂය

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් හා විදේශීය මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී පවත්නා සෑම සුරාබදු කොන්දේසිවලට යටත්ව, 2016 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයන්හි දැක්වෙන රා තැබෑරුම්වල සහ (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2015.08.12 සහ 2015.08.13 දිනයන් හි දී පහත සඳහන් උපලේඛනයන් හි දැක්වෙන වේලාවන් දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමය විය යුතු ය.

*(ආ)* ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර නිල කුවිතාන්සියක් ; සහ

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථෝක්ත රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල සහ විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

*(ඈ)* ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතු ය :

*(ඒ)* ටෙන්ඩර්පත්‍ර මුලුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

*(බී)* සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතු ය.

*(සී)* සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

*(ඩී)* සෑම ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝර්මය සමග තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා ලද නිල කුවිතාන්සියක්, වත්කම් පිළිබඳ සහතිකයත් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ නියමිත තැබෑරුම් අංකය සහ නම සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම්, ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර ''ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ''යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම, එදින ප. ව. 2.00 ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. එම මුදල මා නමින් පුණ්ඩළුඔය මහජන බැංකුවේ වර්ෂයක ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක් පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය.

07. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

08. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

09. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

10. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත්, රා තැබෑරුම් 2015.09.18 වැනි දින පෙ. ව. 10.30ට ද, විදේශ මත්පැන් හල 2015.09.21 වැනි දින පෙ. ව. 10.30ට ද මෙම ස්ථානයේ දී ම විකුණනු ලැබේ.

11. මෙම ටෙන්ඩරය විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබා ගත හැකි ය.

අයි. එම්. සේනානායක,
ප්‍රාදේශීය ලේකම්.
කොත්මලේ.

2015 ජූනි මස 29 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටි ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීම අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රු.)* |
|---|---|---|---|
| *රා තැබෑරුම් :* | | | *රු. ශ.* |
| අංක 1 - කඩදොරපිටිය | කඩදොරපිටිය ග්‍රාමය තුළ | 2015.08.12 පෙ. ව. 10.30 | 1,000 00 |
| අංක 2 - ඕතලාව | තෝරාගනු ලබන ස්ථානයකට කොත්මලේ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතු ය. | 2015.08.12 පෙ.ව. 10.30 | 1,000 00 |
| අංක 3 - කටුකිතුල | කටුකිතුල ග්‍රාමය තුළ | 2015.08.12 පෙ. ව. 10.30 | 1,000 0 |
| *විදේශ මත්පැන් තැබෑරුම :* අංක 2 - පුණ්ඩළුඔය | පුණ්ඩළුඔය නගරය ඉහළ කඩවීදිය | 2015.08.13 පෙ. ව. 10.30 | 3,000 00 |

07-770

---

**මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම- 2016 වර්ෂය**

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂයේ හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත් එම කාලය තුළ දී වලංගුව පවත්වාගෙන යන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 2016 වර්ෂය තුළ විදේශ මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලදී ගැනීම සඳහා මහනුවර, කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් වන ම විසින් 2015.08.20 වැනි දින පෙරවරු 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි ආකෘති පත්‍රයකින් සකස් විය යුතු අතර-

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් කර ඇති අන්දමට ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත්කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතා ගැන විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය.
(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතු ය.
(iii) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපා හැරීමක් මත ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.
(iv) අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය, ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබා ගන්නා ලද,

*(අ)* ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ කුවිතාන්සිය ; සහ
*(ආ)* වත්කම් සහතිකයක්,

සමග ලියුම් කවරයක බහා මුද්‍රාතබන ලියුම් කවරයෙහි වම් කෙළවරේ මුදුනේ "තැබෑරුමේ නම සහ අංකය" සඳහන් කර මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට ප්‍රථම තැන්පත් කළ යුතුයි. එසේ නැතහොත් ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම මහනුවර ප්‍රාදේශීය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් රේන්දයක් වෙනුවෙන් භාරගැනීම අවසන් කරන වේලාව උපලේඛනයෙහි සඳහන් කර ඇත. එම වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා'යි ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු එම දින පස්වරු 2.30 ට පෙර මහනුවර ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කළ යුතු ය. මෙම ගෙවීම මුදලින් හෝ බැංකුවක් විසින් "ගෙවීම සඳහා" යැයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් "ආරක්ෂිත චෙක්පත්" නමැති ස්වරූපයකින් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට මත්පැන් තැබෑරුම් කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය.

06. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකිය.

07. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙන ම පැහැදිලිව දැක්විය යුතු ය.

08. විදේශ මත්පැන් තැබෑරුම්වල හෝ වෙනත් බලපත්‍රයක්ලත් ස්ථානවල හෝ විකිණීම සඳහා තොග විදේශ මත්පැන් නිකුත් නොකරනු ලබන බව සැලකිය යුතු ය.

09. මහනුවර ඇසළ පෙරහැර සමයේ දී හා වෙනත් හේතු මත මෙහි උපලේඛනයේ සඳහන් අංක 01 දරන විදේශ මත්පැන් තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තැබීමේ කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

10. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකිවූ විදේශ මත්පැන් තැබෑරුම්, නැවත විකිණීම 2015.09.28 වැනි දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

11. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසන් තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි හෝ වෙනත් වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැක.

බී. එම්. පී. ජී. පී. වී. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර, කඩවත් සතර සහ ගඟවට කෝරළය.

2015 ජූනි මස 29 වැනි දින,
මහනුවර සහ කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

**2016 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව**

| *අනුක්‍රමික අංක<br>කොට්ඨාසය<br>තැබෑරුම<br>පිහිටුවිය යුතු<br>කොට්ඨාසය<br>තැබෑරුම* | *කොට්ඨාසය* | *තැබෑරුම<br>පිහිටුවිය යුතු<br>කොට්ඨාසය* | *තැබෑරුම්<br>විවෘත කරන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම<br>අවසන් කරන දිනය<br>හා වේලාව* |
|---|---|---|---|---|
| 1 අංක<br>කොළඹ වීදිය | මහනුවර<br>නාගරිකයේ<br>අංක 17<br>යටිනුවර සහ<br>අංක 18<br>කොටුගොඩැල්ල<br>වීදිය | මහනුවර<br>නාගරිකයේ<br>අංක 17<br>යටිනුවර සහ<br>අංක 18 කොටුගොඩැල්ල<br>ඡන්ද කොට්ඨාසය<br>තුළ කොළඹ වීදිය<br>සහ කාසල්හිල් වීදිය<br>මංසන්ධියෙන්<br>කොළඹ වීදිය<br>වඩුගොඩපිටිය පාරේ<br>මංසන්ධියටත් අතර<br>කොළඹ වීදිය දෙපාර්ශ්වයේ | පෙ.ව. 11.00<br>සිට ප.ව.2.00<br>දක්වා<br><br>සහ<br>ප. ව. 5.00 සිට<br>ප.ව. 8.00 දක්වා | 2015.08.20<br>පෙ.ව. 10.30 |

*විදේශ මත්පැන් තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු ටෙන්ඩර් තැන්පත් මුදල* - 2016

1. අංක 1 විදේශ මත්පැන් තැබෑරුම් - රුපියල් 5,000.

07-771/2

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**මහජන බැංකුව - පානදුර ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර තල්පිටි දෙබද්දේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 671/ඒ ගොරකාන දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කෙසෙල්වත්ත කදුරුදුවේ පිහිටි මාදන්ගහඹිවිට අටුන්නගහදෙනියේ කැබැල්ල නමැති ඉඩමේ කැබලි අංක 04 ට අවසර ලත් මානක ජී. ඕ. ආර්. සිල්වා විසින් 2000.08.27 වැනි දින මැන සාදන ලද අංක 3295 දරන පිඹුරේ දක්වෙන කැබලි අංක 04 ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම හතයි තුන (අක්. 0 රූ. 0 පර්. 8.73) ක් විශාල ඉඩමක් සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදිය ද වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2015.08.04 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2015.03.13 වැනි දින ද, දිනමිණ, ඩේලි නිව්ස්, පුවත්පත්වල 2015.02.26 වැනි දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - පානදුර මහජන බැංකු ශාඛාවේ සිට කොළඹ දෙසට කිලෝමීටර් 4ක් පමණ (පරණ ගාලු පාරේ) යන විට හමුවන

ගොරකාන පිට්ටනියට මෙපිටින් වම් අතට ඇති කඳුරුදූව පාරේ මීටර් 100ක් පමණ යන විට හමුවන පාලම පසුකර මීටර් 25ක් පමණ ඉදිරියෙන් දකුණු පසට පිහිටි කොන්ක්‍රීට් කරන ලද පාරේ මීටර් 50ක් පමණ ඉදිරියෙන් පාරේ දකුණු පස මෙම දේපළ පිහිටා ඇත. ප්‍රවේශ බාධා නොමැත. දේපළට පහසුවෙන් වාහනයකින් ප්‍රවේශ විය හැක.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

01. ගැණුම් මිලෙන් 10%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
05. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත සහකාර ප්‍රාදේශීය කළමනාකරු (කළුතර) මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 341, ගාලු පාර, පානදුර යන ලිපිනයට අයත් ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 038 -2232438, 038-2241596, 038 - 4283182
038-2241469 ෆැක්ස් අංකය : 038 - 2232727

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු සාම විනිසුරු,
(මුළු දිවයිනටම).

කාර්යාලය : 25 බී, බෙල්මන්ට් වීදිය, කොළඹ 12
දුරකථන අංක : 011- 5756356, 011 - 2334808 (ෆැක්ස්)
දුරකථන නිවස : 011 - 2419126, 072 - 3836742.

07-868

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - පානදුර ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර නගර සභා සීමාවේ පට්ටිය හි දේශසේවා මාවතේ වරිපනම් අංක 5, (නව අංක 11 D, සහ 11 D 1) දරන ගල්කන්දවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් 1998 සැප්තැම්බර් මස 21 වැනි දින සාදන ලද පිඹුරු අංක 2699 දරන පිඹුරේ ලොට් 1 දරන

*ප්‍රමාණය .-* රූඩ් එකයි පර්චස් හතරයි දශම හත (අ. 0 රූ. 1 පර්. 4.7) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියලුදේත් සමග වේ.

පානදුර දේශසේවා මාවතේ අංක 13 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකා රජයේ අණපනත්වලට අනුකූලව ස්ථාපිත සමාගමක් වන මැග් ගුණසේකර ක්‍රියේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් ද, යොන්මෙරෙන්න සිමන්හේවගේ මංගලිකා ගුණසේකර උකස්කාරිය ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2015 ක් වූ අගෝස්තු මස 10 වැනි දින පෙ. ව. 10.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.07.04 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2015.07.17 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2015.07.20 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.-* පානදුර නගර මාධ්‍යයේ සිට (කොළඹ-ගාල්ල ප්‍රධාන පාරේ ඔරලෝසු කණුව ළඟසිට) 7 වන හරස් වීදිය ඔස්සේ මීටර් 75ක් පමණ ගිය විට ප්‍රධාන වීදිය හමුවේ. එතැනින් දකුණට හැරී එම පාරේ මීටර් 75ක් පමණ ගමන් කර වමට හැරුණු විට හමුවන දේශසේවා මාවත ඔස්සේ මීටර් 75ක් පමණ ගමන් කළ විට අදළ දේපළ වම් අත පැත්තේ ඉදිරියෙන් පිහිටා ඇත. (වරිපනම් අංක 11 D රන්කොත් විහාර ගොඩනැගිල්ලට යාබදව පිහිටා ඇත.)

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා ශෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් අකාලිත වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි, (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ පානදුර ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරික්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු උසාවි කොමසාරිස්.

අංක 200, 2 වැනි මහල, උසාවි පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය 011 - 2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 575 C,
ගාලු පාර, පානදුර.
දුරකථන අංක 038 - 2235643
ෆැක්ස් අංකය : 038 - 2235648.

07-803

**බෙදුම් නඩු තීන්දුවක් යටතේ ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්**

බලපිටිය දිසා අධිකරණයේ දී ය.

01. තෙබුවන ආචාරිගේ කරුණාවතී,
ගලපාත, වඩුමුල්ල, බෙන්තොට
සහ තවත් අයෙක්

.........................*පැමිණිලිකරුවෝ.*

නඩු අංකය :
බෙදුම් /1368

*එදිරිව*

01. ආචාරිගේ චාර්ලිස්හාමි,
ගලපාත, වඩුමුල්ල, බෙන්තොට.
සහ තවත් අය

.......................*විත්තිකරුවන්.*

ඉහත සඳහන් නඩුවේ නියෝගයක් මත මා වෙත නිකුත් කර ඇති කොමිෂන් බලපත්‍රයේ බලය පිට මෙහි උපලේඛනයෙහි මනා ලෙස විස්තර කර ඇති ඉඩමෙන් මෙම නඩුවේ 01, 04, 05, 06 සහ 07 වැනි විත්තිකරුවන්ට අයත් නොබෙදූ හිමිකම් වර්ෂ 2015ක් වූ අගෝස්තු මස 21 වැනි දින පෙරවරු 10.00 ට විෂය වස්තුවට අදාළ ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ ම' විසින් විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*ඉඩමට පිවිසීම.* - ඇල්පිටිය පාරේ සිට වඩුමුල්ලට ඇති රවුම් පාර ඔස්සේ යාර 400ක් පමණ ඉදිරියට ගිය විට මෙම නඩුවට අදාළ වඩුමුල්ලේ පිහිටි ''දිමින්ගුවාවත්ත'' නමැති ඉඩමට පිවිසිය හැකි වේ.

*ගෙවීම් කළ යුතු පිළිවෙල.*- විකිණීම ස්ථිර කර වෙන්දේසිය අවසන් වූ වහාම වැඩිම ලංසු තබන්නා විසින් පහත ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

1. විකුණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අය බදු සියයට එකක් (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2 1/2%),
4. ලිපිකරු ගාස්තු රු. 1,000 ක් සහ සියලුම ප්‍රචාරක වියදම්
5. නොතාරිස් ගාස්තු රු. 2,000 ක් විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා,
6. විකුණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් ඉකුත් වන්නට මත්තෙන් බලපිටිය දිසා අධිකරණයේ බෙදුම් 1368 දරන නඩුවේ ගිණුමට බැර වනසේ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අම්බලන්ගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

විකිණීමට යෝජිත හිමිකම් පිරික්සීම සහ අවශ්‍ය වැඩි විස්තර බලපිටිය දිසා අධිකරණයේ නීතිඥ පද්මා ද සිල්වා මහත්මියගෙන් හෝ වෙන්දේසිකාර තුමාගෙන් දැනගත හැකි වේ.

ඉහත කී උපලේඛනය

මෙම නඩුවට ගොනුකර ඇති බලයලත් මිනින්දෝරු ජී. එල්. ඩබ්ලිව්. පෙරේරා මහතා විසින් මැන සකස් කරන ලද 1987.07.08 වැනි දින හා අංක 146 දරන පිඹුරේ නිරූපිත දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරලේ බෙන්තොට, වඩුමුල්ලේ පිහිටි, ''දිමුන්ගුවාවත්ත'' නම් වූ උතුරට : බඩල්ගෙවත්ත ද, නැගෙනහිරට : දෙළුන්ගහවත්ත ද, දකුණට : දෝබරගේවත්ත ද, බස්නාහිරට : දෙහිගහවත්ත ද, මායිම් වූ රූඩ් දෙකයි, පර්චස් විස්සයි දශම තුනයි අටක් (අක්. 0 රූ. 2, පර්. 20.38) විශාලත්වය ඇති ඉඩමේ මෙම නඩුවේ 01, 04, 05, 06 සහ 07 වැනි විත්තිකරුවන්ට අයත් පර්චස් තුනක් සහ පර්චස් දෙකයි දශම තුනයි අටක් යන දේපළ වේ.

ඩබ්ලිව්. අමරසේන ද සිල්වා,
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

2015 ජූනි මස 30 වැනි දින,
අංක 103/25, පී. ආර්. ද සිල්වා මාවත,
බ්‍රාහ්මණවත්ත, බලපිටිය,
දුරකථන අංකය : 0912257482

07-645

---

**ඩී එෆ් සී සී බැංකුව පීඑල්සී**
(කලින් ඩීඑෆ්සීසී බැංකුව ලෙස හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පණතෙහි 8 වන වගන්තිය යටතේ විකිණීම

**අංක 1167, 1168, 1506, 1569 සහ 1726 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාවට අයත් ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යටිනුවර ගඟවට කෝරළේ, වටරන්තැන්න 238 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වටරන්තැන්න පිහිටි ''වටරන්තැන්න එස්ටේට්'' ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු ටී. බී. සෝමදාස විසින් සාදන ලද, 2002 මාර්තු මස 23 වැනි දිනැති අංක 2723 දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස දක්වෙන සීමා නිර්ණය කර බෙද වෙන් කරන ලද බිම් කට්ටිය (බලයලත් මිනින්දෝරු ආර්. එම්. ඩී. සිල්වා විසින් සාදන ලද 1949 නොවැම්බර් මස 20 වැනි දිනැති අංක 33 දරන පිඹුරේ දක්වෙන වටරන්තැන්න එස්ටේට් හි නැවත මිනුමක් සහ උප කොටස් කිරීමකි)

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූ. 0 පර්. 24.5)

එහි පිහිටි සියල්ල සහිතව ඉහත කී පිඹුරුපත් අංක 2723 ට අනුව මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

2. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාවට අයත් ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යටිනුවර ගඟවට කෝරළේ, වටරන්තැන්න 238 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වටරන්තැන්න පිහිටි ''වටරන්තැන්න එස්ටේට්'' ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු ටී. බී. සෝමදාස විසින් සාදන ලද 2002 මාර්තු මස 23 වැනි දිනැති අංක 2723 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දක්වෙන සීමා නිර්ණය කර බෙද වෙන්කරන ලද බිම් කට්ටිය. (බලයලත් මිනින්දෝරු ආර්. එම්. ඩී. සිල්වා විසින් සාදන ලද 1949 නොවැම්බර් මස 20 වැනි දිනැති අංක 33 දරන පිඹුරේ දක්වෙන වටරන්තැන්න එස්ටේට් හි නැවත මිනුමක් සහ උප කොටස් කිරීමකි)

ඉඩමේ ප්‍රමාණය : අක්. 00 රූ. 1 පර්. 10.8

එහි පිහිටි ගොඩනැගිල්ල සහ සියල්ල සහිතව, ඉහත කී පිඹුරුපත් අංක 2723 ට අනුව මහනුවර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

3. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාවට අයත්, ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යටිනුවර ගඟවට කෝරළේ, වටරන්තැන්න 238 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වටරන්තැන්න පිහිටි ''වටරන්තැන්න එස්ටේට්'' ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු ටී. බී. සෝමදාස විසින් සාදන ලද 2002 මාර්තු මස 23 වැනි දිනැති අංක 2723 දරන පිඹුරේ ලොට් අංක 3 ලෙස දක්වෙන (අඩි 5ක් පළල මාර්ගය සහ D - E ලෙස ලකුණු කර ඇති අඩි 30 ක හැරුම් වටරවුම්) සීමා නිර්ණය කර බෙද වෙන්කරන ලද බිම් කට්ටිය (බලයලත් මිනින්දෝරු ආර්. එම්. ඩී. සිල්වා විසින් සාදන ලද 1949 නොවැම්බර් මස 20 වැනි දිනැති අංක 33 දරන පිඹුරේ දක්වෙන වටරන්තැන්න එස්ටේට් හි නැවත මිනුමක් සහ උප කොටස් කිරීමකි)

/ඉඩමේ ප්‍රමාණය : අක්. 00 රූඩ්. 00 පර්. 4.7 එහි පිහිටි සියල්ල සහිතව, ඉහත කී පිඹුරුපත් අංක 2723 ට අනුව මහනුවර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඉහත ලොට් අංක 1 සහ 3 පහත විස්තර කෙරෙන ඉඩමෙහි නැවත මිනුමක් සහ උප කොටස් කිරීම් වේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාවට අයත්, කටුගස්තොට හෝ මාපනාවතුර පිහිටි වඩා නිවැරදිව යටිනුවර ගඟවට කෝරළේ වටරන්තැන්න පිහිටි ''වටරන්තැන්න එස්ටේට්'' ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු ආර්. එම්. ඩී. සිල්වා විසින් සාදන ලද 1949 නොවැම්බර් මස 20 වැනි දිනැති අංක 33 දරන පිඹුරේ දක්වෙන සීමා නිර්ණය කර බෙද වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 00 රූඩ්. 02 පර්. 00 එහි පිහිටි සියල්ල සහිතව

ඉහත කී පිඹුරුපත් අංක 33 ට අනුව

4. ඉහත ස්ථානයේ පිහිටි බලයලත් මිනින්දෝරු බී. ජේ. සී. ජෝන්ක්ලාස් (Z) විසින් සාදන ලද 1943 ජනවාරි මස 20 වැනි දිනැති ඉහත කී අංක 33 දරන පිඹුරේ A - B ලෙස ලකුණු කර ඇති (අඩි 13ක් පළල සහ අඩි 107ක් දිග) මාර්ග අයිතිය සමග

ඉඩමේ ප්‍රමාණය : අක්. 01 රූඩ් 01 පර්. 35
ඉහත කී පිඹුරුපතට අනුව මහනුවර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සුජානි හපුතන්ත්‍රි විසින් සහතික කරන ලද 2010 නොවැම්බර් මස 16 වැනි දිනැති අංක 1167 සහ 1168 දරන, 2012 මාර්තු 06 වැනි දිනැති අංක 1506 දරන 2012 මැයි 28 වැනි දිනැති අංක 1569 දරන සහ 2013 අප්‍රේල් මස 04 වැනි දිනැති අංක 1726 දරන උකස්කරයන් ප්‍රකාර මහනුවර හන්තාන ඩිස්ට්‍රිබියුටර්ස් නම් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යන මහනුවර පදිංචි ඒකනායක මුදියන්සේලාගේ රංජිත් අනුර විජේසිංහ සහ මල්ලිකා අප්පුහාමිලාගේ ශර්ධා පෙරේරා යන අය විසින් ඩී එෆ් සී සී බැංකුව පී එල් සී (කලින් ඩී එෆ් සී සී බැංකුව) ට උකස් කර ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2015 අගෝස්තු මස 06 වැනි දින (බ්‍රහස්පතින්ද) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% ක (සියයට දෙකහමාර),
4. රු. 79,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011 2442442.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 123 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

07-675

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.